## ශ්‍රී ලංකා
## ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## පාර්ලිමේන්තුව

---

# 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 ඔක්තෝබර් මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 ඔක්තෝබර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : රු. 1.80 | තැපැල් ගාස්තුව : රු. 1.15 යි.

**1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත**

[සහතිකය සටහන් කළේ 1988 ඔක්තෝබර් මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 58/88

**1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත සහ 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

## I වන කොටස

## 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතට සංශෝධන

**2.** මෙහි මින් මතු මේ කොටසෙහි ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 27 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ අනුරු වගන්තියෙහි "තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම ලත් ඡන්ද හිමියකු වෙත" යන වචන වෙනුවට, "තැපැල් ඡන්ද දායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම ලත් ඡන්දහිමියකු වෙත හෝ 127ආ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයකට ඉඩ දෙනු ලැබ ඇත්තේ යම් ඡන්දහිමියකු සම්බන්ධයෙන් ද ඒ ඡන්දහිමියකු වෙත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**1981 අංක 1 දරන පනතේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ඇති සෑම ඡන්දහිමියකුගේ ම නම" යන වචන වෙනුවට, "තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ඇති සෑම ඡන්දහිමියකුගේම නාම සහ 127ආ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයකට ඉඩ දෙනු ලැබ ඇත්තේ යම් ඡන්දහිමියකු සම්බන්ධයෙන් ද ඒ සෑම ඡන්දහිමියකුගේම නම" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** 1988 අංක 15 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "ඒ එක් එක් පක්ෂයේ හෝ කණ්ඩායමේ නම ඉදිරියෙන් ද ඇතුළත් විය යුතු ය. ඉන් ඉක්බිතිවම" යන වචන වෙනුවට "ඒ ඒ කණ්ඩායමේ හඳුනා ගැනීමේ අංකය ඉදිරියෙන් ද ඇතුළත් විය යුතු ය. ඉන් ඉක්බිතිව ම ඊට පහතින්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

5. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය 48 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :—

"ඡන්ද පොළවල කලබල.

48අ. (1) යම්කිසි ස්වභාවයක සිද්ධි ඇතිවීමේ හේතුවෙන්—

(අ) ඡන්ද විමසීම ආරම්භ කිරීමට නියමිත වේලාවේදී ඡන්ද පොළක ඡන්ද විමසීම ආරම්භ කිරීමට නොහැකි වන්නා වූ; හෝ

(ආ) ඡන්ද විමසීම පටන් ගැනීමට නියමිත වේලාවේදී ඒ ඡන්ද පොළෙහි ඡන්ද විමසීම ආරම්භ වූ නමුත් ඡන්ද විමසීම අවසන් කිරීම සඳහා නියමිත වේලාව තෙක් එය පවත්වාගෙන යා නොහැකි වන්නා වූ; හෝ

(ඇ) ඒ ඡන්ද පොළට වෙන් කර දෙන ලද කවර හෝ ඡන්ද පෙට්ටියක් ගණන් කිරීමේ නිලධරයා වෙත භාර දීමට නොහැකි වන්නා වූ

අවස්ථාවක, ඒ ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් අප්‍රමාදව ඒ බව තේරීම්භාර නිලධරයා වෙත දැන්විය යුතු අතර, ඔහු එය කොමසාරිස්වරයාට දැන්විය යුතු ය.

(2) මැතිවරණ කොට්ඨාසයක ඡන්ද පොළක් සම්බන්ධව (1) වන උපවගන්තිය යටතේ දැනුම්දීමක් ලැබුණු විට, ඒ දැනුම්දීමෙහි සත්‍යතාවය නිර්ණය කිරීම පිණිස අවශ්‍යයැයි කොමසාරිස්වරයා විසින් සලකනු ලැබිය හැකි විමසීම් කිරීමෙන් පසුව, ඒ ඡන්දපොළෙහි පවත්වන ලද ඡන්ද විමසීම ශූන්‍ය බවට, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කළ හැකි ය.

(3) මැතිවරණ කොට්ඨාසයක ඡන්ද පොළක් සම්බන්ධව (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් නියමයක් කරනු ලැබූ අවස්ථාවක, IV වන කොටසේ ඇති විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා වූ මැතිවරණයකදී දෙන ලද ඡන්ද ගණන් කිරීම සම්බන්ධයෙන් සහ ඒ මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන්, මේ වගන්තියේ දැක්වෙන සුළු වෙනස් කිරීම්වලට යටත්ව, අදාළ වන්නේ ය.

(4) (2) වන උපවගන්තිය යටතේ වූ නියමයක් කර ඇත්තේ යම් ඡන්දපොළක් සම්බන්ධයෙන් ද ඒ ඡන්දපොළ වෙන් කර දී ඇති ගණන් කිරීමේ මධ්‍යස්ථානය භාර ගණන් කිරීමේ නිලධරයා විසින් 52 වන වගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද, (2) වන උපවගන්තිය යටතේ නියමයක් කර ඇත්තේ යම් ඡන්දපොළක් සම්බන්ධයෙන් ද ඒ ඡන්දපොළෙහි ඡන්ද පෙට්ටි හැර ඔහුගේ මධ්‍යස්ථානයට වෙන්කර දී ඇති ඡන්දපොළවල සියලු ඡන්ද පෙට්ටි ඔහු වෙත ලැබුණු පසුව, ඡන්ද ගණන් කිරීම ආරම්භ කළ යුතු ය.

(5) සියලුම ගණන් කිරීමේ නිලධරයන් විසින් 53 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ සපයන ලද ප්‍රකාශවලින්, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට සහ ස්වාධීන කණ්ඩායමට දෙන ලද ඡන්ද සංඛ්‍යාව සහ ඒ එක් එක් දේශපාලන පක්ෂය හෝ කණ්ඩායම විසින් ඒ මැතිවරණයේදී ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා නාමයෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයකු ((2) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇත්තේ යම් ඡන්ද පොළක් සම්බන්ධව ද ඒ ඡන්ද පොළෙහි දෙන ලද ඡන්ද හැර) ලැබූ මනාප ඡන්ද සංඛ්‍යාව, තේරීම්භාර නිලධරයා විසින් එකතු කර, හරිවැරදි බලා, ඒ පිළිබඳව කොමසාරිස්වරයා වෙත අප්‍රමාදව ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය.

(6) (2) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇත්තේ යම් ඡන්දපොළක් සම්බන්ධයෙන් ද ඒ ඡන්දපොළෙහි දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව හෝ දෙන ලැබීමට ඉඩ තිබුණු ඡන්ද සංඛ්‍යාව ගණන් කිරීමට නොහැකිවීමේ හේතුවෙන්, ඒ මැතිවරණ කොට්ඨාසයේ මැතිවරණ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති නොවන බව (5) වන උපවගන්තිය යටතේ වූ ප්‍රකාශයක් ලැබුණුවිට දී කොමසාරිස්වරයාගේ මතය වන්නා වූ අවස්ථාවක, ඒ ප්‍රකාශයට සහ 60 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත් කිරීමක් කරන ලෙස ඔහු විසින් තේරීම්භාර නිලධරයාට විධාන කළ යුතු ය.

(7) (අ) (2) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇත්තේ යම් ඡන්දපොළක් සම්බන්ධයෙන් ද ඒ ඡන්ද පොළෙහි දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව හෝ දෙනු ලැබීමට ඉඩ තිබුණු ඡන්ද සංඛ්‍යාව ගණන් කිරීමට නොහැකිවීමේ හේතුවෙන්, ඒ මැතිවරණ කොට්ඨාසයේ මැතිවරණ

1 **—ඩී 000911 (88/09)

ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති වන බව (5) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයක් ලැබුණුවිට දී කොමසාරිස්වරයාගේ මතය වන්නා වූ අවස්ථාවක ඒ ඡන්දපොළෙහි අළුතෙන් ඡන්දය විමසීම සඳහා ඔහු විසින් අප්‍රමාදව දිනයක් නියම කළ යුතු ය.

(ආ) අලුතෙන් ඡන්දය විමසන දිනය පිළිබඳව එක් එක් ජාතික භාෂාවෙන් පළවන යටත් පිරිසෙයින් එක් පුවත්පතක බැගින් දැන්වීමක් පළ කිරීමෙන් සහ අදාල ඡන්දපොළ පිහිටා ඇති ඡන්ද කොට්ඨාසයේ ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන දැන්වීම් මගින්, කොමසාරිස්වරයා විසින් දැනුම්දීමක් කළ යුතු ය.

(ඇ) (අ) ඡේදය යටතේ නියම කරන ලද ඡන්ද විමසීමකදී ඡන්දය දීම කෙරෙහි සහ ඒ සම්බන්ධයෙන් 28 වන වගන්තියේ සිට 47 වන වගන්තිය දක්වා වූ (ඒ වගන්ති දෙක ද ඇතුළුව) වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය. ඒ ඡන්ද විමසීමේදී ප්‍රයෝජනයට ගන්නා ඡන්ද හිමි නාමලේඛනය කලින් ඡන්ද විමසීමේදී ප්‍රයෝජනයට ගන්නා ලද ඡන්ද හිමි නාම ලේඛනයම විය යුතු ය.

(ඈ) (අ) ඡේදය යටතේ නියම කරන ලද ඡන්ද විමසීමක් සම්බන්ධයෙන්, 73 වන හා 74 වන වගන්තිවල සහ 79 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්ය සඳහා "ඒ මැතිවරණයේදී ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනය" ගැන ඒ වගන්තිවල ඇති සඳහන ඒ ඡන්ද විමසීම සඳහා නියමිත දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනය ගැන කරන ලද සඳහනක් වූවාක් සේ සැලකිය යුතු ය.

(ඉ) (අ) ඡේදය යටතේ නියම කරන ලද ඡන්ද විමසීමකදී ඡන්දය දීමේ හේතුවෙන් මැතිවරණයක දී එක් වාරයකට වඩා ඡන්දය දෙන තැනැත්තකු, මේ පනත යටතේ යම් වරදකට වරදකරුවකු නොවන ලෙස සැලකිය යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ නියම කරන ලද ඡන්ද විමසීමක් හා සම්බන්ධව, 55 වන වගන්තියේ සඳහන් ලියකියවිලි ලැබුණු විට, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම විසින් ලබා ගන්නා ලදුව (5) වන උපවගන්තිය

යටතේ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රකාශයේ ගෙන හැර දක්වෙන ඡන්ද සංඛ්‍යාව ද ඒ එක් එක් පක්ෂය හෝ කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා විසින් ලබා ගන්නා ලදුව, (5) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රකාශයේ ගෙන හැර දක්වෙන මනාප ඡන්ද සංඛ්‍යාව ද (7) වන උපවගන්තිය යටතේ නියම කරන ලද ඡන්ද විමසීමේ දී ඒ එක් එක් පක්ෂය හෝ කණ්ඩායම ලැබූ ඡන්ද සංඛ්‍යාවට සහ ඒ එක් එක් අපේක්ෂකයා ලැබූ මනාප ඡන්ද සංඛ්‍යාවට තේරීම්භාර නිලධරයා විසින් එකතු කර, ඒ අනුව, 60 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත් කිරීමක් කළ යුතුය.

(9) මේ වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ විධානයක් කිරීමට හෝ (7) වන උපවගන්තිය යටතේ දිනයක් නියම කිරීමට හෝ 24 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමට හෝ පෙර, මේ පනත යටතේ පවත්වනු ලබන මැතිවරණයකදී තරග කරන සෑම පිළිගත් දේශපාලන පක්ෂයකම ලේකම්වරයාගේ සහ සෑම ස්වාධීන කණ්ඩායමකම කණ්ඩායම් නායකයාගේ ද නැතහොත් ඒ ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින් එම කාර්යය සඳහා බලය පවරන ලද නියෝජිතයකුගේ ද අදහස් කොමසාරිස්වරයා විසින් විමසිය යුතු ය.".

6. 1988 අංක 15 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය, එහි අගට මෙහි පහත දැක්වෙන අලුත් උප වගන්තිය එකතු කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(5) මේ වගන්තියේ මීට පෙරාතුව ඇති විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ අසුන හිස්වූ අවස්ථාවක, පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් කොමසාරිස්වරයා වෙත ඒ බව දැනුම් දිය යුතු අතර, අසුන හිස් කළ මන්ත්‍රීවරයා අයත් වූයේ යම් පිළිගත් දේශපාලන පක්ෂයකට ද නැතහොත් ස්වාධීන කණ්ඩායමකට ද ඒ පක්ෂයේ හෝ කණ්ඩායමේ සාමාජිකයකුගේ නම ඒ පුරප්පාඩුව පිරවීම සඳහා යෝජනා කරන ලෙස ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයාට හෝ

කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය යුතු ය. ඒ නාම යෝජනාව ලැබුණු විට, ඒ තැනැත්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තෝරා පත් කර ගන්නා ලදැයි කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කර, එසේ ප්‍රකාශයට පත් කරනු ලැබූ මන්ත්‍රීවරයාගේ නම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. 1988 අංක 15 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය, එහි අගට මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"(9) මහ මැතිවරණයක් තරග කරන පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද නම් ලැයිස්තුවේ නම ඇතුළත් තැනැත්තකු මේ වගන්තියේ කාර්යය සඳහා, අවස්ථාවෝචිත පරිදි, ඒ පිළිගත් දේශපාලන පක්ෂය විසින් හෝ ස්වාධීන කණ්ඩායම විසින් හෝ ඒ මැතිවරණය තරග කිරීම සඳහා නාම යෝජනා කරන ලද අපේක්ෂකයකු වූවාක් සේ සැලකිය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 127අ වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 127අ වගන්තිය අගට මෙහි පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4) කොමසාරිස්වරයා විසින්, මේ වගන්තිය යටතේ ඉල්ලුම් පත් පිළිගනු ලැබ ඇති ලියාපදිංචි ඡන්ද හිමියන්ගේ නම් ලැයිස්තුවක පිටපත් පරීක්ෂා කරනු ලැබීම සඳහා තම කාර්යාලයෙහි සහ අදාළ දිස්ත්‍රික් කාර්යාලවල තැබීමෙන්, එම නම් ලැයිස්තුව ප්‍රසිද්ධ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ 16 වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"ඡන්ද ස්ථාන නියෝජිතයන්.

16අ. (1) තමා සහතික කිරීමේ නිලධරයා වන්නේ යම් කාර්යාලයක්, ඒකකයක් හෝ ආයතනයක් සම්බන්ධයෙන් ද එම කාර්යාලයෙහි, ඒකකයෙහි හෝ ආයතනයෙහි යම් පහත සඳහන් තැපැල් ඡන්ද දායකයන් ලෙස සලකනු ලබන නිලධරයන් සහ සේවකයන් වන එම කාර්යාලයේ ඒකකයේ හෝ ආයතනයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ඡන්දය ගැනීමට තමා අදහස් කරන දිනය සහ ස්ථානය, සහතික කිරීමේ නිල

ධරයා විසින්, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා හෝ එහි බලයලත් නියෝජිතයා හෝ වෙන ද එක් එක් ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා වෙත ද දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් කරනු ලැබුවේ යම් පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්වරයා හෝ එහි බලයලත් නියෝජිතයා හෝ යම් කණ්ඩායම් නායකයකු හෝ වෙන ද ඒ ලේකම්වරයා, බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින් ඡන්ද විමසීම පැවැත්වෙන අතරතුර කිසියම් ඡන්ද ස්ථාන නියෝජිතයකුගේ පත්වීම ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ අවශ්‍යතාව ගැන සැලකිලිමත්ව, ඡන්ද විමසීමේදී පැමිණ සිටීම පිණිස, ඡන්ද ස්ථාන නියෝජිතයන් දෙදෙනකුට නොවැඩි ගණනක් පත් කරනු ලැබිය හැකිය. ඡන්ද විමසීම ආරම්භ වීමට පෙර හෝ ඡන්ද විමසීම පැවැත්වෙන අතරතුර දී, එම ලේකම්වරයා හෝ බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින්, පත් කරන ලද තැනැත්තන්ගේ නම්, ජාතික හැඳුනුම් පත්වල හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් නැතහොත් රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද වෙනත් හැඳුනුම් පත්වල හෝ අංක සහ ලිපිනයන් සඳහන් එවැනි සෑම පත්කිරීමක් ම පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක් සහතික කිරීමේ නිලධරයා වෙත දෙනු ලැබිය යුතු ය.

(3) එම ඡන්ද විමසීමට පැමිණ සිටීමට පත් කරන ලද කිසියම් ඡන්ද ස්ථාන නියෝජිතයකුගේ නම, එවැනි සහතික කිරීමේ නිලධරයකු වෙත දන්වා සිටීමෙන් පසුව එම ලේකම්වරයා, බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින් එම ඡන්ද ස්ථාන නියෝජිතයාගේ පත්වීම ප්‍රත්‍යාදිෂ්ට කර, එම ඡන්ද විමසීමට පැමිණ සිටීම පිණිස වෙනත් ඡන්ද ස්ථාන නියෝජිතයකු පත් කරනු ලබන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, එම ලේකම්වරයා, බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින්, එම පත්වීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳව ද එම ඡන්ද විමසීමේ දී පැමිණ සිටීම පිණිස පත් කරන ලද අලුත් ඡන්ද ස්ථාන නියෝජිතයාගේ නම ද ඔහුගේ ජාතික හැඳුනුම් පතෙහි

හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් නැතහොත් රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද වටිනත් හැඳුනුම් පතෙහි හෝ අංකය ද ඔහුගේ ලිපිනය ද එම නිලධරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය හෝ මගින් නියමිත පරිදි, සහතික කිරීමේ නිලධරයා වෙත නම දැනුම් දෙනු ලැබ නොමැති කිසිම ඡන්ද ස්ථාන නියෝජිතයකු, එවැනි කාර්යාලයක, ඒකකයක හෝ ආයතනයක පැවැත්වෙන ඡන්ද විමසීමකට පැමිණ සිටීම සඳහා ඇතුළු කර නොගත යුතු ය.".

II වන කොටස

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතට සංශෝධන.

**1981 අංක 15 දරන පනතේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**10.** මෙහි මින්මතු, මේ කොටසෙහි, ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතේ 21 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ

(2) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(2) යම් හදිසි හෝ අනපේක්ෂිත අවස්ථාගත කරුණු හේතුකොට ගෙන කවර හෝ මැතිවරණ කොට්ඨාසයක ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීම, තෝරා පත් කිරීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමේ නිශ්චය කොට දැක්වෙන දිනයේ දී සිදු කළ නොහැකි වන අවස්ථාවක, ඒ ඡන්ද විමසීම සිදු කිරීම සඳහා වෙනත් දිනයක් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් කොමසාරිස්වරයා විසින් නියම කළ හැකිය ; ඒ දිනය ධුරය දරන ජනාධිපතිවරයාගේ ධුර කාලය අවසාන වන දිනයට පෙර එක් මාසයකට පසු දිනයක් නොවිය යුතු ය.

(3) මැතිවරණ කොට්ඨාසයක ඡන්ද විමසීමක් සිදු කිරීම සඳහා (2) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් අලුතින් දිනයක් නියම කර ඇති අවස්ථාවක, එම නියමය කරනු ලැබ ඇත්තේ යම් මැතිවරණ කොට්ඨාසයක් සම්බන්ධයෙන්ද එම මැතිවරණ කොට්ඨාශයේ ඡන්ද විමසීම අවසන් වනතුරු සෙසු මැතිවරණ කොට්ඨාස වල දෙන ලබන ඡන්ද ගණන් කිරීම ආරම්භ කරනු නොලැබිය යුතු ය."

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු වගන්තියෙහි, "තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම ඇති ඡන්ද හිමියකුට" යන වචන වෙනුවට "තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම ඇති ඡන්ද හිමියකුට හෝ 119 ආ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයකට ඉඩ දෙනු ලැබ ඇත්තේ යම් ඡන්ද හිමියකු සම්බන්ධයෙන් ද ඒ ඡන්ද හිමියකු වෙත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම ඇති සෑම ඡන්ද හිමියකුගේ ම නම ඉදිරියෙන්" යන වචන වෙනුවට "තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ඇති සෑම ඡන්ද හිමියකුගේ ම නම ඉදිරියෙන් සහ 119ආ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයකට ඉඩ දෙනු ලැබ ඇත්තේ යම් ඡන්ද හිමියකු සම්බන්ධයෙන් ද ඒ සෑම ඡන්ද හිමියකුගේ ම නම ඉදිරියෙන්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 46අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 46අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ඡන්ද පොළවල කලබල. 46අ. (1) යම්කිසි ස්වභාවයක සිද්ධි ඇතිවීමේ හේතුවෙන්—

(අ) ඡන්ද විමසීම ආරම්භ කිරීමට නියමිත වේලාවේ දී ඡන්දපොළක ඡන්ද විමසීම ආරම්භ කිරීමට නොහැකි වන්නා වූ; හෝ

(ආ) ඡන්ද විමසීම පටන් ගැනීමට නියමිත වේලාවේ දී ඒ ඡන්ද පොළෙහි ඡන්ද විමසීම ආරම්භ වූ නමුත් ඡන්ද විමසීම අවසන් කිරීම සඳහා නියමිත වේලාව තෙක් එය පවත්වා ගෙන යා නොහැකි වන්නා වූ; හෝ

(ඇ) ඒ ඡන්ද පොළට හෝ භාර දෙන ලද කවර හෝ ඡන්ද පෙට්ටියක් ගණන් කිරීමේ නිලධරයා වෙත භාර දීමට නොහැකි වන්නා වූ

අවස්ථාවක, ඒ ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් අප්‍රමාදව ඒ බව තේරීම් භාර නිලධරයා වෙත දැන්විය යුතු අතර ඔහු එය කොමසාරිස්වරයාට දැන්විය යුතු ය.

(2) මැතිවරණ කොට්ඨාසයක ඡන්ද පොළක් සම්බන්ධව (1) වන උපවගන්තිය යටතේ දැනුම් දීමක් ලැබුණු විට ඒ දැනුම් දීමෙහි සත්‍යතාවය නිර්ණය කිරීම පිණිස අවශ්‍ය යැයි කොමසාරිස්වරයා විසින් සලකනු ලැබිය හැකි විමසීම් කිරීමෙන් පසුව, ඒ ඡන්ද පොළෙහි පවත්වන ලද ඡන්ද විමසීම ශූන්‍ය බවට, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කළ හැකි ය.

(3) මැතිවරණ කොට්ඨාසයක ඡන්ද පොළක් සම්බන්ධව (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් නියමයක් කරනු ලැබූ අවස්ථාවක IV වන කොටසේ ඇති විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ ඡන්ද පොළෙහි ඡන්ද ගණන් කිරීම සම්බන්ධයෙන් සහ තෝරා පත් කර ගැනීමේ ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන්, මේ වගන්තියේ දැක්වෙන සුළු වෙනස් කිරීම්වලට යටත්ව, අදාළ වන්නේ ය.

(4) (2) වන උපවගන්තිය යටතේ වූ නියමයක් කර ඇත්තේ යම් ඡන්ද පොළක් සම්බන්ධයෙන් ද ඒ ඡන්ද පොළ වෙන් කර දී ඇති ගණන් කිරීමේ මධ්‍යස්ථානය භාර ගණන් කිරීමේ නිලධරයා විසින් 50 වන වගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද, (2) වන උපවගන්තිය යටතේ නියමයක් කර ඇත්තේ යම් ඡන්ද පොළක් සම්බන්ධයෙන් ද ඒ ඡන්ද පොළෙහි ඡන්ද පෙට්ටි හැර, ඔහුගේ මධ්‍යස්ථානයට වෙන් කර දී ඇති ඡන්ද පොළවල සියලු ඡන්ද පෙට්ටි ඔහු වෙත ලැබුණු පසුව, ඡන්ද ගණන් කිරීම ආරම්භ කළ යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇත්තේ යම් ඡන්ද පොළක් සම්බන්ධයෙන් ද ඒ ඡන්ද පොළෙහි දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව හෝ දෙනු ලැබීමට ඉඩ තිබුණු ඡන්ද සංඛ්‍යාව ගණන් කිරීමට නොහැකි වීමේ හේතුවෙන්, තෝරා පත් කර ගැනීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති නොවන බව, සියලුම තේරීම් භාර නිලධරයන් විසින් 55 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත සපයන ලද ප්‍රකාශ ලැබුණු විට දී, කොමසාරිස්වරයාගේ මතය වන්නා වූ අවස්ථාවක ඔහු විසින් 56 වන වගන්තිය යටතේ හෝ 61 වන වගන්තිය යටතේ හෝ ප්‍රකාශයක් කිරීමට ක්‍රියා කළ යුතු ය.

(6) (අ) (2) වන උපවගන්තිය යටතේ නියම යක් කරනු ලැබ ඇත්තේ යම් ඡන්ද පොළක් සම්බන්ධයෙන් ද, ඒ ඡන්ද පොළේ දී දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව හෝ දෙනු ලැබීමට ඉඩ තිබුණු ඡන්ද සංඛ්‍යාව ගණන් කිරීමට නොහැකි වීමේ හේතුවෙන් තෝරා පත් කර ගැනීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති වන බව, සියලුම තේරීම් භාර නිලධරයන් විසින් 55 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත සපයන ලද ප්‍රකාශ ලැබුණු විට දී, කොමසාරිස්වරයාගේ මතය වන්නා වූ අවස්ථාවක, ඒ ඡන්ද පොළෙහි අලුතින් ඡන්ද විමසීමක් පැවැත්වීමට ඔහු විසින් අප්‍රමාදව දින යක් නියම කළ යුතු අතර එසේ නියම කරනු ලබන දිනය ධුරය දරණ ජනාධිපතිවරයාගේ ධුර කාලය අවසාන වන දිනයට පෙර එක් මාසයකට පසු දිනයක් නොවිය යුතු ය. අලුතෙන් ඡන්දය විමසන දිනය පිළිබඳව එක් එක් ජාතික භාෂාවෙන් පළවන, යටත් පිරිසෙයින් එක් ප්‍රවෘත්ති පත්‍රයක බැගින්, දැන්වීමක් පළ කිරීමෙන් සහ ඒ ඡන්ද පොළ පිහිටා ඇති ඡන්ද කොට්ඨාසයේ ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන දැන්වීම් මගින්, කොමසාරිස්වරයා විසින් දැනුම් දීමක් කළ යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ නියම කරන ලද ඡන්ද විමසීමක දී ඡන්දය දීම කෙරෙහි සහ ඒ සම්බන්ධයෙන් 25, 26, 27, 28, 29, 30, 31, 33, 34, 35, 36, 38, 39, 41, 42, 43, 44 සහ 45 යන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය. ඒ ඡන්ද විමසීමේ දී ප්‍රයෝජනයට ගන්නා ඡන්දහිමි නාම ලේඛනය කලින් ඡන්ද විමසීමේ දී ප්‍රයෝජනයට ගන්නා ලද ඡන්දහිමි නාම ලේඛනය ම විය යුතු ය.

(ඇ) (අ) ඡේදය යටතේ නියම කරන ලද ඡන්ද විමසීමක් සම්බන්ධයෙන්, 73 වන හා 74 වන වගන්තිවල සහ 78 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්යය සඳහා "ඡන්ද විමසීමේ දිනයට ඉක්බිතිව ම ඇති දිනය" ගැන ඒ වගන්තිවල ඇති සඳහන ඒ ඡන්ද විමසීම සඳහා නියමිත දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනය ගැන කරන ලද සඳහනක් වූවාක් සේ සැලකිය යුතු ය.

(ඈ) (අ) ඡේදය යටතේ නියම කරන ලද ඡන්ද විමසීමක දී ඡන්දය දීමේ හේතුවෙන්, ඡන්ද විමසීමක දී එක් වාරයකට වඩා ඡන්දය දෙන තැනැත්තකු, මේ පනත යටතේ යම් වරද කට වරදකරුවෙකු නොවන ලෙස සැලකිය යුතු ය.

(7) ඡන්ද පොළක ඡන්ද විමසීම පැවැත්වීම සඳහා අලුතින් දිනයක් (6) වන උප වගන්තිය යටතේ නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ඡන්ද විමසීමේ දී දෙන ලද ඡන්ද සංඛ්‍යාව ගණන් කිරීම සම්පූර්ණ කරනු ලැබ, ඒ ඡන්ද විමසීමේ දී එක් එක් අපේක්ෂකයාට දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව දැක්වෙන, 55 වන වගන්තිය යටතේ වූ ප්‍රකාශ යක් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන තෙක්, 56 වන වගන්තිය හෝ 61 වන වගන් තිය හෝ 63 වන වගන්තිය හෝ යටතේ කොමසා රිස්වරයා විසින් ප්‍රකාශයක් කරනු නොලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයක් කිරීමට හෝ (6) වන උපවගන් තිය යටතේ දිනයක් නියම කිරීමට හෝ 21 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නියම යක් කිරීමට හෝ පෙර, මේ පනත යටතේ පවත් වනු ලබන තෝරා පත්කර ගැනීමක දී තරග කරන සෑම අපේක්ෂකයකුගේ හෝ ඒ අපේක්ෂකයා විසින් එම කාර්යය සඳහා බලය පවරන ලද නියෝ ජිතයකුගේ හෝ අදහස් කොමසාරිස් වරයා විසින් විමසිය යුතු ය. ".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 110 ආ වගන්තිය සංශෝධනය කිරීම.**

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 110ආ වගන්තිය අගට මෙහි පහත දැක් වෙන උපවගන්තිය එකතු කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝ ධනය කරනු ලැබේ:—

" (4) කොමසාරිස්වරයා විසින් මේ වගන්තිය යටතේ ඉල්ලුම් පත් පිළිගනු ලැබ ඇති ලියාපදිංචි ඡන්ද හිමියන්ගේ නාම ලැයිස්තුවක්, එහි පිටපත් පරීක්ෂා කරනු ලැබීම සඳහා නාම කාර්යාලයෙහි සහ අදාළ දිස්ත්‍රික් කාර්යාලවල තැබී මෙන්, එම නාම ලැයිස්තුව ප්‍රසිද්ධ කරනු ලැබීමට සැලැස් විය යුතු ය. ".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයෙහි 16 වන ඡේදය යට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්, ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

" ඡන්ද ස්ථාන නියෝජිතයන්.

16අ. (1) තමා සහතික කිරීමේ නිලධරයා වන්නේ යම් කාර්යාලයක්, ඒකකයක් හෝ ආයතනයක් සම්බන්ධයෙන් ද, එම කාර්යාලයෙහි, ඒකකයෙහි හෝ ආයතනයෙහි මේ පනත යටතේ තැපැල් ඡන්දදායකයන් ලෙස සලකනු ලබන නිලධරයන් සහ සේවකයන් වනු එම කාර්යාලයේ, ඒකකයේ හෝ ආයතනයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ඡන්දය ගැනීමට තමා අදහස් කරන දිනය සහ ස්ථානය, සහතික කිරීමේ නිලධරයා විසින් එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා හෝ බලයලත් නියෝජිතයා හෝ වෙත ද, එක් එක් ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා වෙත ද දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් කරනු ලැබුවේ යම් පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්වරයා හෝ එහි බලයලත් නියෝජිතයා හෝ යම් කණ්ඩායම් නායකයකු හෝ වෙත ද, ඒ ලේකම්වරයා, බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින්, ඡන්දය පැවැත්වෙන අතරතුර කිසියම් ඡන්ද ස්ථාන නියෝජිතයකුගේ පත්වීම ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ අවශ්‍යතාව ගැන සැළකිලිමත් ව, ඡන්ද විමසීමේ දී පැමිණ සිටීම පිණිස, ඡන්ද ස්ථාන නියෝජිතයන් දෙදෙනෙකුට නොවැඩි ගණනක් පත් කරනු ලැබිය හැකි ය. ඡන්ද විමසීම ආරම්භවීමට පෙර හෝ ඡන්ද විමසීම පැවැත්වෙන අතරතුර දී, එම ලේකම්වරයා හෝ බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින්, පත් කරන ලද තැනැත්තන්ගේ නම්, ජාතික හැඳුනුම්පත්වල හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් නැතහොත් රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද වෙනත් හැඳුනුම් පත්වල හෝ අංක සහ ලිපිනයන් සඳහන් එවැනි සෑම පත් කිරීමක් ම පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක් සහතික කිරීමේ නිලධරයා වෙත දෙනු ලැබිය යුතු ය.

(3) එම ඡන්ද විමසීමට පැමිණ සිටීමට පත් කරන ලද කිසියම් ඡන්ද ස්ථාන නියෝජිතයකුගේ නම, එවැනි සහතික කිරීමේ නිලධරයකු වෙත දන්වා සිටීමෙන් පසුව, එම ලේකම්වරයා, බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නාය

කයා හෝ විසින්, එම ඡන්ද ස්ථාන නියෝජිතයාගේ පත්වීම ප්‍රත්‍යාදිෂ්ට කර, එම ඡන්ද විමසීමට පැමිණ සිටීම පිණිස වෙනත් ඡන්ද ස්ථාන නියෝජිතයකු පත්කරනු ලබන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, එම ලේකම්වරයා, බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින්, එම පත්වීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳව ද එම ඡන්ද විමසීමේ දී පැමිණ සිටීම පිණිස පත් කරන ලද අලුත් ඡන්ද ස්ථාන නියෝජිතයාගේ නම ද, ඔහුගේ ජාතික හැඳුනුම්පතෙහි හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් නැත හොත් රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද වෙනත් හැඳුනුම් පතෙහි හෝ අංකය ද ඔහුගේ ලිපිනය ද, එම නිලධරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය හෝ මගින් නියමිත පරිදි, සහතික කිරීමේ නිලධරයා වෙත නම දැනුම් දෙනු ලැබ නොමැති කිසිම ඡන්ද ස්ථාන නියෝජිතයකු, එවැනි කාර්යාලයක, ඒකකයක හෝ ආයතනයක පැවැත්වෙන ඡන්ද විමසීමකට පැමිණ සිටීම සඳහා ඇතුළු කර නොගත යුතු ය.".

## III වන කොටස

## 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතට කරනු ලබන සංශෝධන

1988 අංක 2 දරන පනතට 46අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**16.** (මෙහි මින් මතු දී "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතෙහි 46 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 46අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"ඡන්ද පොළවල කලබල.

46අ. (1) යම්කිසි ස්වභාවයක සිද්ධි ඇතිවීමේ හේතුවෙන්—

(අ) ඡන්ද විමසීම ආරම්භ කිරීමට නියමිත වේලාවේ දී ඡන්ද පොළක ඡන්ද විමසීම ආරම්භ කිරීමට නොහැකි වන්නා වූ; හෝ

(ආ) ඡන්ද විමසීම පටන් ගැනීමට නියමිත වේලාවේ දී ඒ ඡන්ද පොළෙහි ඡන්ද විමසීම ආරම්භ වූ නමුත් ඡන්ද විමසීම අවසන් කිරීම සඳහා නියමිත වේලාව තෙක් එය පවත්වාගෙන යා නොහැකි වන්නා වූ; හෝ

(ඇ) ඒ ඡන්ද පොළට වෙන් කර දෙන ලද කවර හෝ ඡන්ද පෙට්ටියක් ගණන් කිරීමේ නිලධරයා වෙත භාරදීමට නොහැකි වන්නා වූ

අවස්ථාවක, ඒ ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් අප්‍රමාදව ඒ බව තේරීම් භාර නිලධරයා වෙත දැන්විය යුතු අතර ඔහු එය කොමසාරිස්වරයාට දැන්විය යුතු ය.

(2) පරිපාලන දිස්ත්‍රික්කයක ඡන්ද පොළක් සම්බන්ධව (1) වන උපවගන්තිය යටතේ දැනුම් දීමක් ලැබුණු විට, ඒ දැනුම්දීමෙහි සත්‍යතාවය නිර්ණය කිරීම පිණිස අවශ්‍ය යැයි කොමසාරිස්වරයා විසින් සලකනු ලැබිය හැකි විමසීම් කිරීමෙන් පසුව, ඒ ඡන්ද පොළෙහි පවත්වන ලද ඡන්ද විමසීම ශූන්‍ය බවට, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින්, කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කළ හැකි ය.

(3) පරිපාලන දිස්ත්‍රික්කයක ඡන්ද පොළක් සම්බන්ධව (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් නියමයක් කරනු ලැබූ අවස්ථාවක, IV වන කොටසේ ඇති විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා වූ ඡන්ද විමසීමේ දී දෙන ලද ඡන්ද ගණන් කිරීම සම්බන්ධයෙන් සහ ඒ ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන්, මේ වගන්තියේ දැක්වෙන සුළු වෙනස් කිරීම්වලට යටත්ව අදාළ වන්නේ ය.

(4) (2) වන උපවගන්තිය යටතේ වූ නියමයක් කර ඇත්තේ යම් ඡන්ද පොළක් සම්බන්ධයෙන් ද, ඒ ඡන්ද පොළ වෙන් කර දී ඇති ගණන් කිරීමේ මධ්‍යස්ථානය භාර ගණන් කිරීමේ නිලධරයා විසින්, 50 වන වගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද, (2) වන උපවගන්තිය යටතේ නියමයක් කර ඇත්තේ යම් ඡන්ද පොළක් සම්බන්ධයෙන් ද ඒ ඡන්ද පොළෙහි ඡන්ද පෙට්ටි හැර, ඔහුගේ මධ්‍යස්ථානයට වෙන් කර දී ඇති ඡන්ද පොළවල සියලු ඡන්ද පෙට්ටි ඔහු වෙත ලැබුණු පසුව, ඡන්ද ගණන් කිරීම ආරම්භ කළ යුතු ය.

(5) සියලුම ගණන් කිරීමේ නිලධරයන් විසින් 51 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ සපයන ලද ප්‍රකාශවලින්, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට සහ ස්වාධීන කණ්ඩායමට දෙන ලද ඡන්ද සංඛ්‍යාව සහ ඒ එක් එක් දේශපාලන පක්ෂය හෝ කණ්ඩායම විසින් ඒ

ඡන්ද විමසීමේ දී ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා නාමයෝජනා කරන ලද අපේක්ෂකයන් ( (2) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇත්තේ යම් ඡන්ද පොළක් සම්බන්ධව ද ඒ ඡන්ද පොළෙහි දෙන ලද ඡන්ද හැර) ලැබූ මනාප ඡන්ද සංඛ්‍යාව, තේරීම්භාර නිලධරයා විසින් එකතු කර, හරිවැරදි බලා, ඒ පිළිබඳව කොමසාරිස්වරයා වෙත, අප්‍රමාදව ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය.

(6) (2) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇත්තේ යම් ඡන්ද පොළක් සම්බන්ධයෙන් ද ඒ ඡන්ද පොළෙහි දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව හෝ දෙනු ලැබීමට ඉඩ තිබුණු ඡන්ද සංඛ්‍යාව හෝ ගණන් කිරීමට නොහැකි වීමේ හේතුවෙන්, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති නොවන බව (5) වන උපවගන්තිය යටතේ වූ ප්‍රකාශයක් ලැබුණු විට දී කොමසාරිස්වරයාගේ මතය වන්නා වූ අවස්ථාවක, ඒ ප්‍රකාශයට සහ 58 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කිරීමක් කරන ලෙස ඔහු විසින් තේරීම්භාර නිලධරයාට විධාන කළ යුතු ය.

(7) (අ) (2) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇත්තේ යම් ඡන්ද පොළක් සම්බන්ධයෙන් ද ඒ ඡන්ද පොළෙහි දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව හෝ දෙනු ලැබීමට ඉඩ තිබුණු ඡන්ද සංඛ්‍යාව හෝ ගණන් කිරීමට නොහැකි වීමේ හේතුවෙන්, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති වන බව, (5) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයක් ලැබුණු විට දී කොමසාරිස්වරයාගේ මතය වන්නා වූ අවස්ථාවක, ඒ ඡන්ද පොළෙහි අළුතෙන් ඡන්දය විමසීම සඳහා ඔහු විසින් අප්‍රමාදව දිනයක් නියම කළ යුතු ය.

(ආ) අලුතෙන් ඡන්දය විමසන දිනය පිළිබඳව එක් එක් ජාතික භාෂාවෙන් පළවන යටත් පිරිසෙයින් එක් පුවත්පතක බැගින් දැන්වීමක් පළ කිරීමෙන් සහ අදාළ ඡන්ද පොළ පිහිටා ඇති ඡන්ද

කොට්ඨාසයේ ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන දැන්වීම් මගින්, කොමසාරිස්වරයා විසින් දැනුම් දීමක් කළ යුතු ය.

(ඈ) (අ) ඡේදය යටතේ නියම කරන ලද ඡන්ද විමසීමක දී ඡන්දය දීමට සහ ඡන්දය දීම සම්බන්ධයෙන්, 26 වන, 27 වන, 28 වන, 29 වන, 30 වන, 31 වන, 32 වන, 33 වන, 34 වන, 35 වන, 36 වන, 37 වන, 38 වන, 39 වන, 41 වන, 42 වන, 43 වන, 44 වන සහ 45 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය. ඒ ඡන්ද විමසීමේ දී ප්‍රයෝජනයට ගන්නා ඡන්ද හිමි නාම ලේඛනය කලින් ඡන්ද විමසීමේ දී ප්‍රයෝජනයට ගන්නා ලද ඡන්ද හිමි නාම ලේඛනය ම විය යුතු ය.

(ඇ) (අ) ඡේදය යටතේ නියම කරන ලද ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් 73 වන හා 74 වන වගන්තිවල සහ 80 වන වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්ය සඳහා "ඒ ඡන්ද විමසීමේ දී ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනය" ගැන ඒ වගන්තිවල ඇති සඳහන ඒ ඡන්ද විමසීම සඳහා නියමිත දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනය ගැන කරන ලද සඳහනක් වූවාක් සේ සැලකිය යුතු ය.

(ඉ) (අ) ඡේදය යටතේ නියම කරන ලද ඡන්ද විමසීමක දී ඡන්දය දීමේ හේතුවෙන්, ඡන්ද විමසීමක දී එක් වාරයකට වඩා ඡන්දය දෙන තැනැත්තකු, මේ පනත යටතේ යම් වරදකට වරදකරුවකු නොවන ලෙස සැලකිය යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ නියම කරන ලද ඡන්ද විමසීමක් හා සම්බන්ධව, 53 වන වගන්තියේ සඳහන් ලියකියවිලි ලැබුණු විට, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම විසින් ලබා ගන්නා ලදුව (5) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රකාශයේ ගෙන හැර දැක්වෙන ඡන්ද සංඛ්‍යාව ද ඒ එක් එක් පක්ෂය හෝ කණ්ඩායම විසින් නාමයෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා විසින් ලබා ගන්නා ලදුව, (5) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රකාශයේ ගෙන හැර දැක්වෙන මනාප ඡන්ද සංඛ්‍යාව ද (7) වන උපවගන්තිය යටතේ නියම කරන ලද ඡන්ද විමසීමේ දී ඒ එක් එක් පක්ෂය හෝ කණ්ඩායම ලැබූ ඡන්ද සංඛ්‍යාවට සහ

ඒ එක් එක් අපේක්ෂකයා ලැබූ මනාප ඡන්ද සංඛ්‍යාවට, තේරීම් භාර නිලධාරියා විසින් එකතු කර, ඒ අනුව, 58 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් ක්‍රමක් කළ යුතු ය.

(9) මේ වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ විධානයක් කිරීමට හෝ (7) වන උපවගන්තිය යටතේ දිනයක් නියම කිරීමට හෝ 22 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමට හෝ පෙර, මේ පනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක් තරග කරන සෑම දේශපාලන පක්ෂයක ලේකම්වරයාගේ සහ සෑම ස්වාධීන කණ්ඩායමකම කණ්ඩායම් නායකයාගේද නැතහොත් ඒ ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා හෝ ඔවුන් එම කාර්යය සඳහා බලය පවරන ලද නියෝජිතයකුගේ ද අදහස් කොමසාරිස් වරයා විසින් විමසිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.**

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ 16 වන ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්, ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

**" ඡන්ද ස්ථාන නියෝජිතයන්.**

16අ. (1) තමා සහතික කිරීමේ නිලධරයා වන්නේ යම් කාර්යාලයක්, ඒකකයක් හෝ ආයතනයක් සම්බන්ධයෙන් ද එම කාර්යාලයෙහි, ඒකකයෙහි හෝ ආයතනයෙහි මේ පනත යටතේ තැපැල් ඡන්දදායකයන් ලෙස සලකනු ලබන නිලධරයන් සහ සේවකයන් වන එම කාර්යාලයේ, ඒකකයේ හෝ ආයතනයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ඡන්දය ගැනීමට තමා අදහස් කරන දිනය සහ ස්ථානය, සහතික කිරීමේ නිලධරයා විසින්, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා හෝ එහි බලයලත් නියෝජිතයා හෝ වෙත ද එක් එක් ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා වෙත ද දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් කරනු ලැබුවේ යම් පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්වරයා හෝ එහි බලයලත් නියෝජිතයා හෝ යම් කණ්ඩායම් නායකයකු හෝ වෙත ද, ඒ ලේකම් වරයා, බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින්, ඡන්දය පැවැත්වෙන අතර තුර කිසියම් ඡන්ද ස්ථාන නියෝජිතයකුගේ පත් වීම ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ අවශ්‍යතාව ගැන සැලකිලි මත් ව, ඡන්ද විමසීමේ දී පැමිණ සිටීම පිණිස, ඡන්ද ස්ථාන නියෝජිතයන් දෙදෙනකුට නොවැඩි

ගණනක් පත් කරනු ලැබිය හැකිය. ඡන්ද විමසීම ආරම්භ වීමට පෙර හෝ ඡන්ද විමසීම පැවැත්වෙන අතරතුර දී, එම ලේකම්වරයා හෝ බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින්, පත් කරන ලද තැනැත්තන්ගේ නම්, ජාතික හැඳුනුම් පත්වල හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් නැතහොත් රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද වෙනත් හැඳුනුම්පත්වල හෝ අංක සහ ලිපිනයන් සඳහන් එවැනි සෑම පත් කිරීමක් ම පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක් සහතික කිරීමේ නිලධරයා වෙත දෙනු ලැබිය යුතු ය.

(3) එම ඡන්ද විමසීමට පැමිණ සිටීමට පත් කරන ලද කිසියම් ඡන්ද ස්ථාන නියෝජිතයකුගේ නම, එවැනි සහතික කිරීමේ නිලධරයකු වෙත දන්වා සිටීමෙන් පසුව, එම ලේකම්වරයා, බලය ලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින්, එම ඡන්ද ස්ථාන නියෝජිතයාගේ පත්වීම ප්‍රත්‍යාදිෂ්ට කර, එම ඡන්ද විමසීමට පැමිණ සිටීම පිණිස වෙනත් ඡන්ද ස්ථාන නියෝජිතයකු පත් කරනු ලබන අවස්ථාවක, අවස්ථෝචිත පරිදි, එම ලේකම්වරයා, බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින්, එම පත්වීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳව ද එම ඡන්ද විමසීමේ දී පැමිණ සිටීම පිණිස පත් කරන ලද අලුත් ඡන්ද ස්ථාන නියෝජිතයාගේ නම ද, ඔහුගේ ජාතික හැඳුනුම් පතෙහි හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් නැතහොත් රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද වෙනත් හැඳුනුම්පතෙහි හෝ අංකය ද ඔහුගේ ලිපිනය ද, එම නිලධරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය හෝ මගින් නියමිත පරිදි, සහතික කිරීමේ නිලධරයා වෙත නම දැනුම් දෙනු ලැබ නොමැති කිසිම ඡන්ද ස්ථාන නියෝජිතයකු, එවැනි කාර්යාලයක, ඒකකයක හෝ ආයතනයක පැවැත්වෙන ඡන්ද විමසීමකට පැමිණ සිටීම සඳහා ඇතුළු කර නොගත යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.